**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදල - 2013**

**------------------------------------------------------------------------**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අවසාන ගිණුම් සඳහා අදාළ වන සටහන් සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරුතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීත්තර විගණන ආයතනයේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගම් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයෝජන ලෙස රු.90,275,000 ක් දක්වා තිබුණ ද, අදාළ ආයෝජන සමාගම බුන්වත් වී තිබුණ බැවින් හානිකරණය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395 (ඇ) ඡේදය | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, බැංකු ගිණුම් 05 කට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 94 (1) වගන්තිය | ප්‍රතිපාදන නොමැතිව හා පූර්ව අනුමැතියකින් තොරව ගොඩනැගිලි හා සවිකිරීම් වැඩි දියුණු කිරීම සඳහා රු.485,006 ක වියදම් දරා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.351,550,815 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 287,126,146 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 64,424,669 කින් හෙවත් සියයට 22 කින් වැඩිවී තිබුණි. එම වැඩිවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් අය කරනු ලබන ගාස්තු වැඩි කිරීම විශේෂයෙන්ම බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය වැඩිවීම කෙරෙහි පහත සඳහන් කරුණු බලපා තිබුණි.

| විස්තරය | ආදායම | | | |
|---|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය | පෙර වර්ෂය | මූල්‍ය අතිරික්තය | පූර්ව වර්ෂයට වඩා වෙනසේ ප්‍රතිශතය |
| **ආදායම** | රු. | රු. | රු. | |
| ගොනු පරීක්ෂා කිරීම් | 5,423,500 | 2,546,620 | 2,876,800 | 112.97 |
| නාම අනුමත කිරීම | 12,075,000 | 7,097,000 | 4,978,000 | 70.14 |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 111,545,649 | 41,273,300 | 70,272,349 | 170.26 |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 149,265,000 | 101,206,500 | 48,058,500 | 47.48 |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,867,000 | 1,480,000 | 1,387,000 | 93.72 |
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 1,140,000 | 1,005,500 | 134,500 | 13.38 |

2013 ජනවාරි 01 දින සිට ඉහත සඳහන් කාර්යයන් සඳහා අයකරනු ලැබූ ගාස්තු සංශෝධනය නිසා පෙර වර්ෂයට සාපේක්ෂව සාමාලෝචිත වර්ෂයේදි සියලුම ආදායම් වැඩිවී තිබුණ ද තථ්‍ය කාර්ය සාධනයේ භෞතික වැඩිවීමක් නිරීක්ෂණය නොවීය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ භෞතික කාර්යසාධනයේ පිරිහීමක් පහත පරිදි නිරීක්ෂණය විය.

| කාර්යය | සංඛ්‍යාව 2013 | සංඛ්‍යාව 2012 | වෙනස අඩුවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| සමාගම් ලියාපදංචි කිරීම | 6,047 | 7,089 | (1,042) | (17) |
| ගොනු පරීක්ෂා කිරීම් | 10,847 | 12,729 | (1,882) | (15) |
| නාම අනුමත කිරීම | 12,075 | 14,194 | (2,119) | (15) |
| පිටපත් සහතික කිරීම | 36,531 | 38,459 | (1,928) | (5) |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 70,659 | 74,304 | (3,992) | (12) |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 29,853 | 33,845 | (3,992) | (12) |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,867 | 2,959 | (92) | (3) |
| ආකෘති පත්‍ර අලෙවිය | 4,207 | 4,368 | (161) | (4) |
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 437 | 622 | (185) | (30) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී සීමිත සාමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම්, 2012 වර්ෂයට සාපේක්ෂව 3,992 කින් හෙවත් සියයට 12 කින් අඩු වී තිබුණද ආදායම රු. මිලියන 101 සිට රු. මිලියන 149 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම අනෙකුත් සියළුම කාර්යයන්ගේ ප්‍රගතිය භෞතිකව අඩුවී තිබුණ ද ආදායම් වැඩිවී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලියාපදිංචි සීමිත සමාගම් සංඛ්‍යාව 62,508 ක් වූ අතර එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු සීමිත සමාගම් සංඛ්‍යාව 52,990 ක් විය. එසේ වුව ද එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ සීමිත සමාගම් සංඛ්‍යාව 14,084 ක් වූයෙන් වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකළ සීමිත සමාගම් ප්‍රමාණය 38,906 ක් වූ අතර එදිනට අයකර නොගත් හිඟ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම රු. 64,843,333 ක් විය.

(ආ) <u>**2007 අංක 07 දරන සමාගම් පනත**</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) <u>**සීමිත සමාගම් නියාමනය**</u>

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට සමාගම් පනතෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වන ලියාපදිංචි සීමිත සමාගම්වල කටයුතු නියාමනය ඉතා දුර්වල තත්ත්වයක පැවති අතර නියාමනය සඳහා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. ලියාපදිංචි මූල්‍ය සමාගම්, සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකළ අවස්ථා නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ii) **<u>සීමිත සමාගම් විගණකයින් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේදී නව විගණකවරුන් 74 දෙනෙකු අලුතෙන් ලියාපදිංචි වී තිබූ අතර, ඉන් ලැබූ ආදායම රු. 9,990 ක් විය. 2012 වර්ෂයේදී අලුතෙන් ලියාපදිංචි වූ 84 දෙනෙකුගෙන් ලැබූ ආදායම රු. 11,340 ක් වූයෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 12 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි විගණකවරුන්ගේ අලුත් කිරීම් 556 ක් වූ අතර ආදායම රු. 12,232 ක් විය. පසුගිය වර්ෂයේදී එම ප්‍රමාණය 444 ක් වූ අතර ලැබූ ආදායම රු. 9,768 ක් වූයෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 25 කින් වැඩි වී තිබුණි. තවද විගණකවරුන් දැනුවත් කිරීම හා නියාමනය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) **<u>1891 අංක 16 දරන සමිති ආඥා පනත</u>**

සමාලෝචිත වර්ෂයේදී, සමිති ආඥා පනත යටතේ සමිති 169 ක් ලියාපදිංචි කර තිබූ අතර, සමිති ලියාපදිංචියෙන් ලැබූ මුද්දර ආදායම රු. 4,225 ක් විය. 2010 සිට 2013 දක්වා කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද සමිති සංඛ්‍යාවේ අඛණ්ඩ අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී එය සියයට 75 දක්වා අඩු වී තිබුණි.

(ඈ) **<u>1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත</u>**

පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ විධිවිධාන අනුව රු. මිලියන 5 ක් ඉක්මවන සියලුම කොන්ත්‍රාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කළ යුතු අතර, සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව වූ 4,251 ක් විය. ඉකුත් වර්ෂයේදී එය 4,414 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාවේ සියයට 4 ක අඩුවීමක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන</u>

සීමිත සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 වර්ෂය සඳහා රු. මිලියන 140 ක් වෙන් කර තිබුණද එම මුළු ප්‍රතිපාදිත මුදලම උපයෝජනය කර නොතිබුණි. එම ව්‍යාපෘතිය සඳහා පරිපාලන වියදම් වශයෙන් තවත් රු. 2,800,000 ක අතිරේක ප්‍රතිපාදිත මුදලක් ලබාගෙන ඉන් රු. 1,086,000 ක් පරිගණක සහ ඊට අදාල මෘදුකාංග මිලදී ගැනීම සඳහා පමණක් වියදම් කර තිබුණි. එම ප්‍රතිපාදනයෙන් ඌන උපයෝජිත මුදල සියයට 61 ක් විය.

(ආ) දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල පිහිටි ඉඩම, ප්‍රවාහන අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත පවරා ගැනීමට 2007 සැප්තැම්බර් 12 දිනැති අංක 07/1616/342/020 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. තවද ඒ සඳහා 2012 ජුනි මස 26 දින රු. 35,510,750 ක් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත්, මෙම ඉඩම දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි.

(ඇ) අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව ගොඩනැගිලි නවීකරණය සඳහා 2013 වර්ෂයේදී රු. මිලියන 8 ක් වෙන් කර තිබුණද, ඉන් රු. මිලියන 1.11 ක් පමණක් වියදම් කර තිබූ හෙයින් රු. මිලියන 6.89 හෙවත් සියයට 86 ක් ඉතිරි වී තිබුණි. මේ අනුව, ආයතනයේ නවීකරණ ක්‍රියාවලිය ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2013 වර්ෂයේදී අරමුදලේ අයවැය මඟින් පුහුණු කිරීම් හා ධාරිතා වර්ධනය සඳහා රු. මිලියන 0.4 ක් වෙන් කර තිබූ අතර ඉන් රු.මිලියන 0.12 ක් හෙවත් සියයට 30 ක් පමණක් වියදම් කර තිබුණි. මේ අනුව පුහුණු කිරීම් හා ධාරිතා සංවර්ධන කටයුතු ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, නිලධාරීන් පුහුණු කිරීම් හා ධාරිතා සංවර්ධනය සඳහා වූ විධිමත් වැඩපිළිවෙලක්ද පිළියෙල කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2007 අංක 01 දරන සමාගම් පනතේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලබන සියලුම වියදම් අරමුදලින් දැරිය හැකි වුවත්, සමාගම් පනතේ 4 වන උප වගන්තිය යටතේ අනුමත වියදම් යටතට නොගැනෙන, සීමිත පෞද්ගලික සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා රු. 90,275,000 ක් වැයකර තිබුණි. මෙම කොටස්වල අයිතිය සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට හිමි වී තිබූ අතර, අදාල සමාගම බූන්වත්වීම නිසා එය ඈවර කිරීමට තීරණය කර තිබුණි. මේ දක්වා මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාගම් අරමුදලට ලැබී නොතිබුණි.

## 4.4 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

සමාගම් අරමුදලේ බැංකු ගිණුමෙහි 2013 වර්ෂය තුළදී රු. මිලියන 13 ක සාමාන්‍ය මුදල් ශේෂයක් නිරතුරුව පැවතුණු අතර, එම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කර නොතිබීම නිසා සමාගම් අරමුදලට ලබා ගත හැකිව තිබූ පොළී ආදායම් අහිමි වී තිබුණි.

## 4.5 සේවක මණ්ඩල කළමනාකරණය

සමාගම් අරමුදලේ කටයුතු මෙහෙයවන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඇතුළුව ඉහළ මට්ටමේ තනතුරු 03 ක් ඇතුළු තනතුරු 30 ක් 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුනි. මෙම තත්ත්වය සමාගම් අරමුදලේ කටයුතු මෙහෙයවීම සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අහිතකර ලෙස බලපෑ හැකි යැයි යන්න විගනනයේදී බැහැර කළ නොහැකි විය.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂයට අදාලව පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම මඟින් අරමුදල විසින් තම අරමුණු ඉටු කර ගැනීම සඳහා සිදු කරනු ලබන එක් එක් කාර්යයන්ගේ ස්වභාවය සහ ඒවා සඳහා වගකිව යුතු නිලධාරීන් සහ අංශ පිළිබඳව වෙන වෙනම දක්වා නොතිබුණි. ඒ අනුව විගණනයේදී ක්‍රියාකාරී සැලැස්ම මඟින් අරමුදලේ කාර්යසාධනය ඇගැයීම අපහසු විය.

## 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්.ඒ./2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම්/නියාමනය කිරීම්
(ඇ) ප්‍රසම්පාදනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය